***ඊ මේල් ලිපියක සිංහල පරිවර්තනයකි***

***ලලිත් වීරතුංග මයා (lalith@icta.lk) වෙතින්***
***කන්සල්ටන්ට්ස් 21 ලිමිටඩ් (consultants21@gmail.com) වෙත***
*දිනය : 2009 දෙසැම්බර් 8, අඟහරුවාදා පෙ.ව. 6.33*

## දුරකථන සාකච්ඡාව සම්බන්ධවයි

හිතවත් නිහාල්,

පසුගිය වසර ස්වල්පය තුලදී වුන සිදුවීම් පිළිබඳව ඔබගේ ඍජු විචාරණයන් සහ තියුණු විශ්ලේෂණයන් ගැන ඔබට ස්තුතියි. රජය වෙනුවෙන් මුලා ගනුදෙනු විශ්ලේෂණය කිරීමට මට විශේෂ කුසලතාවයක් නොමැති බැවින්, බොහෝමයක් සඳහා ප්‍රතිචාර දැක්වීමට මට පහසු නොවනු ඇත. නමුත්, සිදුවන්නාවූ ගනුදෙනු කුමක් හෝ වේවා, එවා විනිවිද පෙනෙන පරිදි සහ ක්‍රියාත්මක කිරීමට ඉඩ ඇති අවකාශයන් ඇතුලත වියයුතු බව කීම යෝග්‍ය වේ.

කෙසේවෙතත්, ඔබ පවත්වාගෙන යනු ලබන තත්වයන් රඳවා ගත හැක්කේ ස්වල්ප දෙනෙකුට පමනක් වන බැවින් ඔබ කරන්නාවූ යහපත් කර්තව්‍යයන් කරුණාකර දිගටම කරගෙන යන්න.

උණුසුම් ශුභාශිංසන,

ලලිත්

***ලලිත් වීරතුංග***
*ජනාධිපති ලේකම්*
*ජනාධිපති ලේකම් කාර්යාලය*
*කොළඹ 1.*

සත්‍ය පිටපතකි.

අත්සන් කලේ:- නිහාල් ශ්‍රී අමරසේකර

-----------------

අදාල ලියවිල්ලේ සත්‍ය සහ නිවැරදි පරිවර්තනයක් බවට සහතික කරමි.

15/02/2010
15/02/2010

**බී. තිස්ස ප්‍රනාන්දු.**
කොළඹ දිසා අධිකරණයේ දිවුරුම්දුන්
භාෂා පරිවර්තක,
169/4, ගාලුපාර,
කොල්ලුපිටිය,
කොළඹ 03.
දු. ක. 011 - 2454929

බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ දිසා අධිකරණයේ
දිවුරුම් දුන් භාෂා පරිවර්තක
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. කා: 2454929
ඇමරිකානු තානාපති කාර්යාලය
ඉදිරිපිට

***<u>ඊ මේල් ලිපියක සිංහල පරිවර්තනයකි</u>***

*කන්සල්ටන්ස් 21 ලිමිටඩ් (consultants21@gmail.com)වෙතින්*
*ලලිත් වීරතුංග මයා (lalith@icta.lk)වෙත*
*පිටපත: ගෝඨාභය රාජපක්ෂ (rajapakg@gmail.com)*
*දිනය : 2009 දෙසැම්බර් 5, සෙනසුරදා පෙ.ව. 10.31*

## දූරකථන සාකච්ඡාව සම්බන්ධවයි

හිතවත් ලලිත්,

2009.11.30 සඳුදා දින ඔබ මා සමඟ කළ දූරකථන සාකච්ඡාව සහ මා විසින් ඔබට ඊ-මේලයක් එවනු ඇතැයි දැනුම් දී සිටීම කෙරෙහි අවධානය යොමු කරමි. මා සමඟ කතාකරන ලෙසට දන්වමින් ඔබ ඔවුන්ට කතා කළ බව දැනුම් දෙමින්, දිලිත් ජයවීර, වාසුදේව නානායක්කාර සහ පූජ්‍ය ඇල්ලේ ගුණවංශ හිමි ද මා සමඟ කතා කළහ. ඇත්ත වශයෙන්ම, වසන්ත කරන්නාගොඩ සමඟින් දිලිත් පැමිණ මා බැහැදැක, අර්ථවත් සාකච්ඡාවක් අප අතර පැවතුණි. එම සන්දර්භය කරණ කොට ගෙන මෙම ඊ-මේලයේ පිටපත් එම පුද්ගලයින්ට යවන්නෙමි.

කාරණයන් කෙරෙහි ඕනෑකමින් කල්පනාකර බැලීම මැනවයි මට සිතුණි. මෙම ඊ-මේලය එවීමේ සුළු ප්‍රමාදය එනිසාය. ඔබට සහතික වූ පරිදි, සුළුපටු ප්‍රශ්ණ මත නොව රටෙහි උන්නතිය වඩාත් පුළුල් දර්ශණයකින් අවධානයට ගනිමින් සියලු කල්හිම මම ක්‍රියා කරන්නෙමි. ජාතික හා මහජන හිත අරඹයා මා සැම කල්හිම ක්‍රියා කොට ඇත. ඔව්, මම බොහෝ ලෙසින්ම දේශපාලනඥයෙකු වන්නෙමි. ඒ මන්ද යත්, නිදහස ලැබීම පටන්ම රට වනසමින්,ආත්මාර්ථකාමී ලෙස ස්වකීය වාසිය පමණක් තකමින් දේශපාලනඥයින් වශයෙන් බොරු වෙස් වලාගත් අයවලුන් මෙන් නොව,ඊට වෙනස් ලෙස රටෙහි සම්පත් අයත් වන්නාවූ මහජනයාගේ හිත පිණිස මම සැම කල්හිම ක්‍රියා කොට ඇත. එවකට සංවර්ධනයෙහිලා අප රටට බොහෝ ලෙසින්ම පසුපසින් වූ සහ අප රට සමග තරඟකිරීමට එවකට මුල පිරූ සිංගප්පූරුව, අද අප රට දුක්ඛදායි තත්ත්වයක තිබියදී, අසීමිත සීඝ්‍ර පිම්මකින් ඉදිරියට ඇදී සංවර්ධනය වී ඇත.

2009.11.24 'ඩේලි මිරර්' පුවත්පතෙහි වාර්තා කර තිබුන පරිදි 'අල්ලස් සහ දූෂණය අපරට විනාශයට පත්කොට ඇත. දූෂණය මැඩලීමට ප්‍රමාණවත් නෛතික ව්‍යුහය රාමුවක් ඇත. අඩුපාඩු ලෙස පවතින්නේ මෙම ව්‍යවස්ථාදායක නීතින් නිසියාකාරව ක්‍රියාවෙහි නොයෙදවීමයි.' යනුවෙන් ජනාධිපතිතුමා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි පවසා තිබුන බවට උපුටා දක්වා තිබුණි. *ව්‍යවස්ථාදායක නීතින් නිසියාකාරව ක්‍රියාවෙහි යෙදවීම සහ නීතියේ ආධිපත්‍ය බලාත්මක නොකළ අයට එරෙහිව දැඩිලෙස ක්‍රියාකිරීමේ වගකීම සතුව ඇත්තේ ජනාධිපතිතුමාට නොවන්නේ ද ?*

'විවෘත ආර්ථිකය දූෂණයට මඟ පෑදුවේය - වංචාව සහ දූෂණය විවෘත ආර්ථිකය සමඟ සම්පව වෙලී පැටලී ඇත. විවෘත ආර්ථික ක්‍රමය රටෙහි වංචා සහ දූෂණය ජනිතවීම සඳහා මඟ සැලසුවේය. රටෙහි වංචාව සහ දූෂණය මැඩලීම සඳහා රජය විසින් හැකි සියළුම පියවරයන් ගන්නවා ඇත. වංචාවෙන් තොර රටක් සංවර්ධනයට විවරයක් වන අතර දූෂණය සහ වංචාවෙහි නියැලි අයවලුන් කෙරෙහි දැඩි ලෙස ක්‍රියා කරනු ලැබේ' - යනුවෙන් මාධ්‍ය පිරිස් අමතමින් ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කල බව ඉන් අනතුරුව 2009.11.27 දින 'ඩේලි නිවුස්' පුවත්පතෙහි වාර්තා කර තිබුණි. අන් ඕනෑම විවෘත ආර්ථික රටකට මෙන්ම, *ඉතා අල්ප වශයෙන් වංචාව සහ දූෂණය පවතින සහ වංචාව සහ දූෂණයට එරෙහිව දැඩිලෙස ක්‍රියා කරන්නාවූ සිංගප්පූරුවටද නිදහස් ආර්ථිකයක් ඇත. ඇත්ත වශයෙන්ම හොඳාකාරවම දන්නා පරිදි අධික ලෙසින්ම දූෂණ මට්ටමක් ඇත්තේ සමාජවාදී රටවලය !*

ඉහත සන්දර්භය පිළිබඳව මම පහත දැක්වෙන කාරණයන් ගෙනහැර දක්වමි:

1. අල්ලස් පනතේ 70 වගන්තියේ අරුත දක්වා ඇති පරිදි දූෂණය සිදුවීම සහ 1982 අංක 12 දරණ රාජ්‍ය දේපලවලට එරෙහිව වරද සිදුකිරීම් පනතේ විෂය සීමාව යටතට වැටෙන රාජ්‍ය දේපල වංචා කිරීමේ පැහැදිලි අනාවරණයක් සහිතව, එවකට අමාත්‍ය මිලින්ද මොරගොඩ සහ එවකට රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ (PERC) සභාපති පී.බී.ජයසුන්දර යටතේ PERC විසින් කරන ලද LMSL සමාගම පුද්ගලීකරණය කිරීම අවලංගු කරමින් සහ එම ගනුදෙනුව සාවද්‍ය, නීතිවිරෝධී සහ අනෛතික වන බවට ප්‍රකාශ කරමින් 2008.07.21 දින දරණ නඩු තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

**බී තිස්ස ප්‍රනාන්දු**
**කොළඹ දිසා අධිකරණයේ**
**දිවුරුම් දුන් භාෂා පරිවර්තක**
**169/4 ගාලු පාර, කොල්ලුපිටිය**
**කොළඹ 03.**
**දු. කා: 2454929**
**ඇමරිකානු තානාපති කාර්යාලය**

2. එලෙසින්ම අල්ලස් පනතේ 70 වගන්තියේ නිර්වචනය කර ඇති පරිදි දූෂණය සිදුවීම සහ 1982 අංක.12 දරණ රාජ්‍ය දේපල වලට එරෙහිව වරද සිදුකිරීමෙහි පනතේ විෂය සීමාව යටතට වැටෙන රාජ්‍ය දේපල වංචා කිරීමේ පැහැදිලි අනාවරණයක් සහිතව එවකට අමාත්‍ය මිලින්ද මොරගොඩ සහ එවකට රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ (PERC) සභාපති පී.බී.ජයසුන්දර යටතේ PERC විසින් සිදුකල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (SLIC) පුද්ගලීකරණය සාවද්‍ය, නීති විරෝධී, අනෛතික සහ වංචනික වූණ බවට ප්‍රකාශ කර අවලංගු කරමින් 2009.06.04 දින දරණ නඩු තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

3. (අ) අවසානයේ පහත දැක්වෙන අයුරින් ප්‍රකාශ කරමින්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් LMSL නඩු තීන්දුවේ ඔහුට විරුද්ධව බැරෑරුම් සහ බරපතල නිගමනයන් කරමින්, එවකට PERC සභාපතිවරයා මෙන්ම මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන්ද පී.බී.ජයසුන්දරගේ ක්‍රියාවරියාව සහ ක්‍රියාකාරකම් උග්‍ර දෝෂාරෝපනයට ලක්කරන ලදී !

> "8 වන වගඋත්තරකාර පී.බී.ජයසුන්දරගේ ක්‍රියාකාරකම් අත්තනෝමතික සහ බලය ඉක්මවායාමක් පමණක් නොව සී/ස ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමාගමට වාසිදායක සහ පක්ෂග්‍රාහී වන බවටත් නඩු තීන්දුවෙහි නිගමනයන්ගෙන් පිළිබිඹු කර දක්වයි. එම සමාගමට අනෛතික ලාභ වාසි උපයා ගැනීම සඳහා ඔහු මහජන යහපතට එරෙහිව, ජෝන් කීල්ස් සමාගමේ එස්.රත්නායක සමඟ වංක සහයෝගයකින් යුතුව ක්‍රියා කර ඇතැයි යන පෙත්සම්කරුගේ චෝදනාව ස්ථාපිත වේ."

(ආ) 1994 අංක.20 දරණ අල්ලස (සංශෝධන) පනත මගින් සංශෝධිත, අල්ලස් පනතේ 70 වගන්තියේ මෙසේ නියම කර ඇත.

> "දූෂණය :70. රජයට සාවද්‍ය හෝ නීතිවිරෝධී පාඩු සිදුකිරීමේ හෝ කිනම් පුද්ගලයකුට හෝ සාවද්‍ය හෝ නීතිවිරෝධී ප්‍රතිලාභයක්, වාසියක් හෝ ප්‍රයෝජනයක් පිරිනැමීමේ චේතනාවෙන් යුතුව හෝ කිනම් පුද්ගලයකුට හෝ රජයට යම් සාවද්‍ය හෝ නීතිවිරෝධී පාඩුවක් සිදුවෙතැයි හෝ යම් පුද්ගලයකුට යම් සාවද්‍ය හෝ නීතිවිරෝධී ප්‍රතිලාභයක්, වාසියක් හෝ ප්‍රයෝජනයක් පිරිනැමෙතැයි යන දැනුමෙන් යුතුව, යම් රාජ්‍ය සේවකයකු:
>
> (අ) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ තනතුරෙහි නිල බලයෙන් ඔහුට කිරීමට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් කලහොත් හෝ කිරීමෙන් වැලකී සිටීම.
>
> (ආ) රාජ්‍ය සේවකයකු වශයෙන්, ඔහුගේ තනතුරෙහි නිලබලයෙන් ඔහුට කිරීමට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉන් වැලකී සිටීමට යම් රාජ්‍ය සේවකයකු පෙළඹවීම.
>
> (ඇ) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ නිලබලයෙන්, ඔහුගේ දැනුමට ලක්වන යම් තොරතුරක් භාවිතා කිරීම.
>
> (ඈ) රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ නිල බලයෙන් යම් තීරණයක් කිරීමෙහිලා සහභාගී වීම.
>
> (ඉ) එවැනි රාජ්‍ය සේවකයකු වශයෙන් ඔහුගේ නිලය සෘජුව හෝ අනියම් ලෙස භාවිතා කරමින්, යම් ක්‍රියාවක් සිදුකිරීමට හෝ සිදුකිරීමෙන් වැළකී සිටීමට යම් පුද්ගලයෙකු පෙළඹවීම.
>
> දූෂණ වරදට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු මගින් ලඝු නඩු විභාගයක් මත වරදකරුවකු කලහොත්, වසර 10ක් නොඉක්මවන කාලසීමාවක සිරදඬුවමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එවැනි සිරදඬුවමක් සහ දඩයක් යන දෙකටම යටත් වන්නේය."

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉහත කී නිගමනයන් දූෂණය වරදෙහි අර්ථය ඇතුලතට නොවැටෙන්නේද ? අල්ලස් කොමිෂන් සභාව විසින් මාගේද කටඋත්තරය සටහන් කර ගැනීම ඇතුළුව, විමර්ශන පැවැත්වූ අතර මෙම වංචනික ගනුදෙනුවෙහි නියුක්තවූ නොයෙක් දෙනෙකුට එරෙහිව නඩු පැවරීමේ ක්‍රියාවළියක යෙදී සිටින බව මට දැනගන්නට ලැබී ඇත. මතභේදකාරී තත්වයන් යටතේ පී.බී ජයසුන්දර මහ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් පත් කිරීමත් සමඟ, අනිත් අතට කිසිදු ක්‍රියා මර්ගයක් නොගැනීම ගැන දෝෂාරෝපණයට ලක්ව ඇති නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ට දී ඇති සංඥාව කුමක්ද ?



බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ දිසා අධිකරණයේ
දිවුරුම් දුන් භාෂා පරිවර්තක
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. කා: 2454929
ඇමරිකානු තානාපති කාර්යාලය

4. (අ) පවත්වන්නට යෙදුන විමර්ෂණවල පදනම මත ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපතිතුමාගේ උපදෙස් පතා ඇතැයි LMSL නඩුවේදී නීතිපතිතුමා විසින් 2008.12.15 දින ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී සිටියේය. අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ෂණ පවත්වා ඇති බව සහ ගතයුතු ක්‍රියා මාර්ගයන් පිළිබඳව උපදෙස් පතමින් වාර්තාවක් නීතිපතිතුමා වෙත යවා ඇති බවත්, *නීතිපතිතුමාගේ උපදෙස් බලාපොරොත්තුවෙන් සිටින බවත්*, නැවත සනාථ කරමින් ඉන් අනතුරුව මාස 10 කට පසු 2009.10.11 දින පොලිස්පතිවරයා විසින් වාසුදේව නානායක්කාරගේ නීතිඥවරුන් වෙත ලියා දන්වා සිටින ලදී !

(ආ) එළිදරව් වී ඇති ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම් රාජ්‍ය නිලධාරීන් හා සම්බන්ධ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානයන් යටතේ වන වැරදි ක්‍රියාවන් වනවාට අමතරව, 1982 අංක.12 දරන රාජ්‍ය දේපලවලට එරෙහි වූ වැරදි ක්‍රියාවන් යටතට වැටෙති. මා විසින් ඉදිරිපත් කරන ලද 2008.09.29 දින දරණ සටහන මගින් මා ගත් ස්ථාවරයන්ට ශ්‍රේෂ්ඨාධිකරණය සහගාමී වූන අතර ඒ අනුව ගතයුතු ක්‍රියා මාර්ගයන් ගැනීම සඳහා එය නීතිපතිතුමා වෙත භාරදෙන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධානය කරන ලදි. වංචනික ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා (SLIC) ගනුදෙනුව පිළිබඳව ඒ හා සමානවම අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ හෝ නීතිපතිතුමා විසින් ගෙන ඇති ක්‍රියා මාර්ගයන් කුමක් ද? ජිප් රථයක් ආපසු නොදීමේ චෝදනාවක ප්‍රශ්නයක් මත *නැසීගිය ශ්‍රීපති සූරියආරච්චි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට එරෙහිව ගෙන තිබුන ක්ෂණික ක්‍රියාමාර්ගය සමඟ මෙය සසඳා බලනු මැනවි.*

5. (අ) ඔවුන්ට එරෙහිව බැරෑරුම් සහ බරපතල නිගමනයන් කරමින්, LMSL සහ SLIC නඩු තීන්දු දෙකෙහිම මිලින්ද මොරගොඩ සහ පී.බී.ජයසුන්දර දෙදෙනාගේම ක්‍රියාදාමයන් සහ ක්‍රියාකාරකම් උග්‍ර දෝෂාරෝපණයට ලක්කර තිබුනි. එය සුළුකොට සලකා, උසස්මතම අධිකරණය විසින් කර තිබූනු ඉහතකී බැරෑරුම් සහ බරපතල නිගමනයන්හි පදනම මත ඔහුටම විරුද්ධව නීතිය බලාත්මක කිරීමට අවශ්‍ය කරන අධිකරණ සහ නීතිය බලාත්මක කිරීමේ යෙදිය යුතු නිළධාරීන් කෙරෙහි පාලනය ක්‍රියාත්මක කෙරෙන, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් මිලින්ද මොරගොඩ, අන් සියළු නානාන්තරයන් තිබියදී පත් කරන ලදී. *එය නීතියේ ආධිපත්‍යයට පයින් ගැසීමක් සහ අධිකරණය නිගාවට සහ සමච්චලයට ලක් කරන්නක් නොවන්නේ ද ?*

(ආ) මිලින්ද මොරගොඩගේ පවුලේ උදවියට අයත්ව, ඔහු එහි අධ්‍යක්ෂක වශයෙන්ද, පාලනය කල සී/ස මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම විසින් 11% ක වාර්ෂික පොලියක් මත රුපියල් මිලියන 1.700 ක ණය මුදල් 1990/1991 හිදී ලබාගෙන 2004.12.31 දිනට එවැනි පොළිය ද ඇතුළුව, 11% ක වාර්ෂික පොළියක් මත අද දිනට රුපියල් මිලියන 7.900 කට ආසන්නව ගණනය වන්නාවූ, රුපියල් මිලියන 4700 ක් ශ්‍රී ලංකා මහා බැංකුවට ගෙවීම පැහැර හැර ඇති බව අනාවරණය කරමින්, අසාර්ථක මූල්‍ය සමාගම් පිළිබඳව විමර්ෂනය කිරීමට ජනාධිපතිතුමා විසින් පත්කල ජනාධිපති විමසීම් කොමිෂන් සභාව සම්බන්ධයෙන්, රාජ්‍ය ව්‍යවසාය පිළිබද පාර්ලිමේන්තු අනුකමිටුව විසින් 2005 හිදී, වෙනත් දේ අතර, වාර්තා කලේය. මහජන හිත පිණිස මමද මෙම කොමිෂන් සභාව ඉදිරියේදී සාක්ෂි දුන්නෙමි. *මෙම ජනාධිපති විමසීම් කොමිෂන් සභාවට සිදුවූයේ කුමක් ද ?*

6 (අ) එලෙසින්ම, ඉහත කී අනාවරණ වීම් සහ ඔහු විසින් විසංවාදි නොවී පැවතුන සහ පවතින, මවිසින් ඔබටද පිටපතක් ඉදිරිපත් කල ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර සිටි මාගේ දිවුරුම් ප්‍රකාශයෙහි මා විසින් කර තිබුණු අතිකූත් අනාවරණයන්ද නොතකමින්, පී.බී. ජයසුන්දර මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ලෙස පත්කරන ලදි. උසස්තම අධිකරණය මගින් දෙන ලද ඉහත කී නඩු තීන්දු වල නිගමනයන් සහ විගණකාධිපතිවරයා සහ පාර්ලිමේන්තු අනුකමිටු විසින් ඔහුට එරෙහිව කරන ලද දෝෂාරෝපණයන්ද ඇතුලත් වූන විසංවාදි වීමකින් තොරව පවතින අධිකරණය ඉදිරියේ වූ අනාවරණ වීම්ද අභියස, රටෙහි මුදල් භාරව සිටීමට පී.බී.ජයසුන්දර මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වශයෙන් පත් කිරීම යමෙකුට යුක්ති සහගත කර සිටිය හැකි ද? *එසේ වී ඇති කල්හි, නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් අක්‍රියවීම ගැන යමෙකුට විලාප නැගිය හැක්කේ කෙසේ ද ?*



**බී තිස්ස ප්‍රනාන්දු**
**කොළඹ දිසා අධිකරණයේ**
**දිවුරුම් දුන් භාෂා පරිවර්තක**
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. ක: 2454929
ඇමරිකානු තානාපති කාර්යාලය
ඉදිරිපිට

(ආ) 14(උ) ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාර, යමෙකු විසින් තමාගේම වෘත්තියෙහි සහ රැකියාවේ නියුක්තවීමේ අයිතිය ද ඇතුළුව, මූලික අයිතිවාසිකම් සහ නිදහස ක්‍රියාත්මක කිරීම සහ භුක්ති විඳීම, 28 (ඇ) ව්‍යවස්ථාව ප්‍රකාර, *පොදු දේපල සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම ද පොදු දේපල අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට* එරෙහිව ක්‍රියා කිරීම ද ඇතුළත් වන්නාවූ, මූලික යුතුකම් හා බැඳීම්වලින් වෙන්ව පැවතිය නොහැකි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 ව්‍යවස්ථාවේ නියම කර ඇත. අයථා ලෙස පරිහරණය කරන ලද්දාවූ පොදු දේපලෙහි වටිනාකමේ 300% ක දඩයකට අමතරව වසර 20 ක් දක්වා සිරදඬුවමක දඬුවමක් 1982 අංක.12 දරණ පොදු දේපලවලට එරෙහිවූ වරදන් පනත මගින් පමුණුවා ඇත්තේ ඒ නිසා නොවන්නේ ද?

(ඇ) LMSL සහ SLIC සිද්ධීන්වල රජයෙන් අයුතු ලෙස පරිහරණය කරන ලද සහ/හෝ වංචා කරන ලද ඉතාමත් වටිනා පොදු දේපල ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හරියාකාරව රජයට නැවත පමුණුවන ලදී. ඒනිසා එයට ආධාර සහ අනුබල දී ඇති අයවලුන්ද ඇතුළුව, එහි නියුක්ත වූ සියළු දෙනාටම එරෙහිව 1982 අංක.12 දරණ පොදු දේපලට එරෙහි වරදන් පනතේ නියමයන් ප්‍රකාර ගැනීමට තුඩු දී ඇති ක්‍රියා මාර්ගයන් ගැනීම තර්කාන්විත සහ විචාරශීලී නොවන්නේ ද?

7 (අ) වෙනත් දේ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 28 ව්‍යවස්ථාව කෙරෙහි අවධානය යොමු කරමින් සහ ඔහුට බන්ධනයකින් තොර බලපුළුවන්කම් නොමැති බවට කියා පාමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කිරීමට ජනාධිපතිතුමාගේ යුතුකම සහ බැඳීම පිළිබඳව විග්‍රහ කර දක්වා තිබුන එහි පිටු 2 නියුණු ලෙස බැහැර කොට, ශිරාණි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමියගේ විසම්මිතික (dissenting)නඩු තීන්දුව සහතික කොට ජන මාධ්‍යhට සහ මට නිකුත් කරන ලදී.

(ආ) අත්සන් නොකල නඩු තීන්දුවේ මෘදු පිටපතේ මුලික අකුරු වර්ගය වෙනස් කර විශාල කොට පිටු 16 ක නඩු තීන්දුව පිටු 18 ක් කොට, ඉන් අනතුරුව 16, 17 සහ 18 පිටු ඉවත්කොට, කලින් පිටුවට සම්බන්ධතාවයක් නොමැති අසම්පූර්ණ ජේදයකින් ආරම්භ වන වෙනස්වූ කුඩා අකුරු වර්ගයකින්යුත්, මූලික නඩු තීන්දුවේ 16 පිටුවේ අත්සන් කළ පිටපතක් අමුණා, එමගින් මූලික නඩු තීන්දුවේ 14 සහ 15 පිටු අතහැර ඇති බැවින්, මෙය හුදෙක් අත්වැරැද්දක් නොව, චේතනාත්මක ක්‍රියාවක් වන්නේය. මෙය තැතිගන්වන සුළු කම්පනයට පත් කරන්නක් නොවන්නෙහිද ?

8 (අ) නඩු කීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආනුෂංගිකව, යථා පරිදි රජය වෙත නැවත සතු කල පොදු දේපල වංචා කිරීමද සහිතව, LMSL සහ SLIC පුද්ගලීකරණයන් සහ සම්බන්ධ නෛතික ගිවිසුම් සාවද්‍ය, අනෛතික, නීති විරෝධී සහ වංචනික ලෙසට අවලංගු කළ අතර, එය නොතකමින්, එවැනි අනෛතික නීති විරෝධී සහ වංචනික ගිවිසුම්වලට වගකිව යුතු සහ නඩු දෙකේ පෙත්සම් දෙකෙහි සම්ප්‍රකාශයන් තර්කයට ලක් කොට විරෝධතා ගොනු කිරීමෙන් වැලකී සහ මගහැර සිටි, PERC ආයතනයේ නීති අධ්‍යක්ෂක, මුදල් අමාත්‍යාංශයේ නීති උපදේශක වශයෙන් තත්වය උසස් කර නොමැතිද ? අප රටෙහි නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත කරන්නේ මේ අන්දමට ද ?

(ආ) SLIC නඩු තීන්දුවෙහි SLIC විගණකවරුන් වන අර්නස්ට් සහ යං වහාම ඉවත් කරන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධානය කරන ලද අතර, විපර්තකාරී SLIC ගනුදෙනුව මෙහෙයවීමේ දී රජයට උපදේශකවරුන් ලෙස නිරතවුන ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් සමාගමේ අයෝග්‍ය වෘත්තීමය ක්‍රියා චර්යාව සහ ක්‍රියාදාමයන් එයින් අනාවරණය කරන ලදි. PERC ආයතනය විසින් නිමකල පැමිණිලි කෙටුම්පත්ද සහිතව, ඔවුන් අතවූ බරපතල වෘත්තිමය නොසැලකිලිමත්කම් පිළිබඳව නෛතික ක්‍රියාමාර්ගයන් ගැනීම සඳහා 2005 පෙබරවාරි සහ මැයි මාසවලදී නීතිපතිතුමා විසින් අර්නස්ට් සහ යං සහ ප්‍රයිස්වෝටර් හවුස්කූපර්ස් වෙත දැනුම්දීමක් කරන ලදි. *එවැනි ක්‍රියා මාර්ගයන් ගැනීම මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරියට ගෙන නොගියේ මන් ද?*

9. ඉතාමත්ම වෙහෙසදායි සහ පීඩාකාරී නඩු කීම්වලට ආනුෂාංගිකව, LMSL සහ SLIC පුද්ගලිකකරණයන් අවලංගු කරන ලදි. රටෙහි මහජනයාගේ හිත පිණිස වුන එම ප්‍රයත්නයන්ට මහා භාණ්ඩාගාරයේ ලේකම් පී.බී.ජයසුන්දර සහ නීතිපතිවරයා එරෙහි වුහ. එවැනි හේතු තත්වයන් මත, එයින් රජයට හිමිවුන ප්‍රතිලාභ උපචය විය යුත්තේ මහා භාණ්ඩාගාරයට නොව, අත්පා සහ ජිවිත පවා පූජා කළ සන්නද්ධ හමුදාවේ සෙබළුන්ගේ පවුල්වලට එය බෙදා හැරිය යුතු වන බවද මම දැනටමත් ඔබට පෙරැත්ත කර ඇත. සිද්ධාන්තම තත්වය දෙස බැලු කල්හි, රජය නියෝජනය කල නීතිපතිතුමා එයට එරෙහි වන ලදුව, මෙම පොදු ආයතන රජය විසින් පවරාගෙන ඇතැයි යමෙකු කියා සිටිම අසා සිටිය හැක්කේ කෙසේද? එය සත්‍යතාවයෙන් බොහෝ ලෙසින්ම දුරස්ථය.



බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ දිසා අධිකරණයේ
දිවුරුම් දුන් භාෂා පරිවර්තක
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. කා: 2454929

10 (අ) එවැනි ගනුදෙනුවලට අනොන්‍යාව විශේෂඥ ඥානයකින් තොරවූ සහ නෛවනාවක් පමණක් රැස්වූන "අධ්‍යයන කණ්ඩායම" කින් එය විධානය කර ක්‍රියාත්මක කල එවකට මහා භාණ්ඩාගාරයේ ලේකම් පී.බී.ජයසුන්දර විසින්, බොළඳ සහ ලුහුඩු වාර්තාවක් ලබාගෙන, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට, එය සංස්ථාගත කළ පනතේ බලය ද ඉක්මවා යමින් එළඹීමට සිදු කල "ඛණිජ තෙල් මිළ පහත වැටීමට ඇහුරුම් ගනුදෙනු" (OIL HEDGING AGREEMENT") වලට එරෙහිව මහජන හිත පිණිස මවිසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කල පෙත්සම් දෙක මවිසින් ඔබට එවා ඇත.

(ආ) මාගේ ස්ථාවරය වන්නේ මේවා ඔට්ටු ඇල්ලීමේ/ඔට්ටු තැබීමේ/සූදු කෙළීමේ කොන්ත්‍රාත්තුව වන බවත්, එබැවින් අනෛතික කොන්ත්‍රාත්තු වන අතර, ඒ අනුව නීතියෙහිලා එවා බලාත්මක කළ නොහැකි බවත්ය. සූදු ආඥා පනත යටතේ ගැමි ජනයා අත්අඩංගුව ගෙන ඔට්ටු ඇල්ලීමේ/සූදු කෙළීමේ වරදට ඔවුන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ. මහජන හිත පිණිස මාගේම රටේ මම නඩු මගට බැස ඇති අතර, විදේශීය බැංකු විසින් විදේශ අධිකරණ ප්‍රදේශයන්හි නඩුකරයන්/බේරුම් කිරීම් ඉදිරියට ගෙන යාම වලක්වාලීමට විශේෂඥ උපදෙස් සහිතව මවිසින් තහනම් නියෝග ඉල්ලා ඇත.

(ඇ) මවිසින් මුල්ම නඩුව පවරන ලද සැනින්ම අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට කඩා වැදී, කටඋත්තර සටහන් කොට, නොයෙකුත් ලේඛණ අත් අඩංගුවට ගන්නා ලදි. රාජ්‍ය නිළධාරීන් පොළඹවා ගැනීමකට ලක්කර ඇතිදැයි යන ප්‍රශ්නය මතු කරමින්, සහභාගී වූන විදේශීය බැංකු 3 ක් විසින්, නියුක්තවූන රාජ්‍ය නිළධාරීන්ට සහ ඔවුන්ගේ පවුල්වල උදවියට නවාතැන් පහසුකම් සහිතව, "විදේශීය කෙටිගමන් " ප්‍රත්‍යක්ෂ ලෙස සැලසූ බවට සාක්ෂි මගින් පිළිගත් ලෙස එළිදරව්වූන මෙවැනි අතිමහත් නීති විරෝධී නින්දිත දෑ පිළිබඳව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ නීතිපතිතුමා විසින් ගත් ක්‍රියා මාර්ගය කුමක් ද?

(ඈ) මෙම නඩු තහවුරු කිරීම සඳහා 2009.07.14 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ ගැණුනු අවස්ථාවේ, විදේශ ප්‍රදේශවල නෛතික නඩු හබ සහ බේරුම් කිරීම් වලට එරෙහිව දැඩි ලෙස විත්තිවාචක කියා සිටීමේ ඔහු නිරතව සිටින බැවින්, මාගේ ඉල්ලීම් මත ඒවා ඉදිරියට ගෙන යෑමට අවසර දෙනවාට ඔහු ප්‍රබල ලෙසින්ම විරුද්ධ වන බව උපහාසාත්මක ලෙස ද නීතිපතිතුමා අධිකරණයට දන්වා සිටියේය. මෙය සිදුවූයේ, මෙම ගනුදෙනු, වෙනත් දේ අතර අනෛතික, බලය ඉක්මවා යාමක් සහ බලරහිත වන බවත්, ශූන්‍ය සහ බලරහිත සහ බලාත්මක කළ නොහැකි මෙම ගනුදෙනුවල ඇත්ත ස්වභාවය බැංකු විසින් වරදවා පෙන්නුම් කර දී ඇති බවත්, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති මේජර් ජනරාල් ආසෝක තෝරදෙණිය ඔහුගේ දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශ කිරීම නොතකමිනි. රාජ්‍ය බැංකුවක් වන මහජන බැංකුවේ නීතිඥවරයාද "කල් ඉක්මවීමේ" පදනම මත විරුද්ධ වූවද මහජන බැංකුවේ කොන්ත්‍රාත්තු නිමාවට පත්වන්නේ 2009 අගෝස්තු සහ 2009 ඔක්තෝබර් හිදි පමණි.

(ඉ) ලෝක බැංකුවේ අනුග්‍රහය යටතේ ආයෝජන ආරවුල් සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICSID) ඉදිරියේ බේරුම් කිරීමක් ඩොයිෂ් (Deutsch) බැංකුව විසින් ද, එක්සත් රාජධානියේ මහාධිකරණයේ නෛතික නඩුකරයක්, ස්ටැන්ඩඩ් චාටර්ඩ් බැංකුව විසින් සහ එක්සත් රාජධානියේ බේරුම් කිරීම් මහාධිකරණයේ බේරුම් කිරීමක් සිටි බැංකුව විසින් ද පවරා ඇති බව මට දැනගන්නට ලැබී ඇත. මට දැන ගන්නට ඇති තොරතුරු අනුව, මෙම විදෙස් නඩු හබයන්ට එරෙහි විත්තිවාචකදීම සඳහා 2009 සැප්තැම්බර් තෙක් දරා ඇති ගාස්තු රුපියල් මිලියන 110 කට ආසනන්ව ගණනය වී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය සඳහා අයවැය රුපියල් මිලියන 15 ක් සහ නීතිපති දෙපාර්තමේන්තුවට අයවැය රුපියල් මිලියන 127 ක් වූන 2010 වසරේ මාස 4 ක් සඳහා ගිණුම මෙය සමග සසදා බලන්න.

(ඊ) ඉහත කී ගණනයට එක්සත් රාජධානියේ පවුම් 340,000/- ක් ඉයුරෝ 75,000/- ක් සහ එක්සත් ජනපද ඩොලර් 75,000/- ක්ද ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාගේ ගාස්තු වශයෙන් පැයකට එක්සත් රාජධානියේ පවුම් 1700/- ක් (රු.325,000/-) සහ කණිෂ්ඨ නීතිඥවරයාගේ ගාස්තු වශයෙන් පැයකට එක්සත් රාජධානියේ පවුම් 700/- ක් (රු.135,000/-) සහ සිද්ධියෙන් පසුව පමණක් යොදවන ලද හෙඩ්ජිං විශේෂඥයකුගේ ගාස්තු එක්සත් රාජධානියේ පවුම් 2500/- (රු.480,000/-) ක්ද ඇතුලත් වන බව මට දැන ගන්නට ලැබී ඇත.



බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ [illegible] අධිකරණයේ
දිවුරුම් [illegible] සර්වර්තක
169/4 [illegible] කොල්ලුපිටිය
කොළඹ 03.
දු. කා: 2454929
ඇමරිකානු තානාපති කාර්යාලය

(ඩ) සිටි බැංකුව විසින් රජයෙන් 2008.12.22 වන විට එක්සත් ජනපද ඩොලර් මිලියන 194 ක් ඉල්ලා තිබුන බව කලින් මහා භාණ්ඩාගාරයේ ලේකම් සුමිත් අබේසිංහ විසින් ඔහුගේ දිවුරුම් ප්‍රකාශයෙහි ප්‍රකාශ කර ඇති අතර, 2008 නොවැම්බර් අගට වුනු ගණන් බැලීම ප්‍රකාර සිටි බැංකුවේ කොන්ත්‍රාත්තු 2 සඳහා ආගණනය එක්සත් ජනපද ඩොලර් මිලියන 64 වටාද, 2008 දෙසැම්බර් අගට එක්සත් ජනපද ඩොලර් මිලියන 87 වටාද විය. එනිසා එක්සත් ජනපද ඩොලර් මිලියන 194 ට ISDA ගිවිසුම් ප්‍රකාර දෛනික වැල් පොලී පදනම මත වාණිජ පොලී අනුපාතිකයද ඇතුළත්වියේද යන ප්‍රශ්ණය පැන නගී. සිටි බැංකු කොන්ත්‍රාත්තු දෙක 2009 ජූනි සහ 2009 ජූලි මාසවලදී නිමා වෙමින් පැවති අතර, *2008 දෙසැම්බර් මසින් පසුව කාලසීමාව සඳහා බණිජ තෙල්වල මිල මට්ටම් නොදැන සිටි නිසා 2008 දෙසැම්බර් මසට පසුව වන මාසයන් සඳහා එවකට ඉල්ලුම්කිරීම් කිසිවක් කළ නොහැකි වුනි.*

(ඩෟ) බණිජ තෙල් මිල පහත වැටීම ඇහුරුම් කිරීමේ මෙම (Oil Hedging Deals) ගනුදෙනු පිළිබඳව ජාතික සහ මහජන හිත පිණිස 2009.05.25 සහ 2009.06.25 දින නාක්වූ ඉහත කී ගොනු කල මාගේ පෙත්සම් 2010.3.22 දින තහවුරු කිරීමට තිබෙන අතර සහ එයින් එක් පෙත්සමක් සංශෝධනය කිරීම තහවුරු කිරීම 2010.02.11 දිනට නියම කර තිබියදී අධිකරණයේ පූර්ව අවසරයක් නොමැතිව, ඔහු පෙත්සම දෙවරක් සංශෝධනය කළ පෞද්ගලික සහ තමාගේම හිත සුව පිණිස වුන කාරණයක් සම්බන්ධයෙන් වුන 2009.07.07 දින පී.බී.ජයසුන්දර විසින් ගොනු කල පෙත්සම, අනිත් අතට, නීතිපතිතුමා පැහැදිලි ලෙසම ඔහුත් සමග එක්ව යාත්‍රා කිරීම සහිතව, 2009.10.13 වන විට ශ්‍රේෂ්ඨාකරණයේ 7 ත් සාමාජික විනිසුරු මඩුල්ලක් විසින් අසා නිමාවට පත් කරන ලදී. රටෙහි මහජනයාට බලපාන (Oil Hedging Deals) පිළිබඳව නීතිපතිතුමාගේ ඉරියව්ව, මෙය හා සසඳා බලනු මැනවි.

(එ) යෙදෙන පොළී කිසිවක් ගණනයට නොගෙන 2009 ඔක්තෝබර් මස වන විටදී සමාප්ත කළ සියළුම කොන්ත්‍රාත්තු සඳහා මුළු උද්දේශිත හිමිකම් පෑම එක්සත් ජනපද ඩොලර් මිලියන 503 කට ආසන්නව ගණනය වන අතර, එය හා සසඳන කල්හි ශ්‍රී ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව සමාර්ථ වූයේ නම්, එයට එක්සත් ජනපද ඩොලර් මිලියන 10.5 ක පමණක් වූ ලාභ වාසියක් ලැබීමේ තත්වයක පැවතුණි. දෛනික පදනමක් මත සංයුක්ත කර ඇතැයි අනුමාන කරන වාණිජ පොළියක් සහිත ව සිටි බැංකුවේ හිමිකම පෑමේ සම්බන්ධතාවය අනුව යෙදෙන පොළී සහිතව උද්දේශිත හිමිකම පෑම එක්සත් ජනපද ඩොලර් මිලියන 2000 කට ආසන්න සීමාවකට නැගෙනු ඇත. මේවා සුදු කෙළිමට යොදවන ලද මහජන මුදල්ය. මහජන මුදල් සමග ඔට්ටු ඇල්ලීමෙහිලා මහජන විශ්වාස දහම නොහික්මුන ලෙස උල්ලංඝනය කල පුද්ගලයන්ට එරෙහිව ක්‍රියා කිරීමට රජය විසින් අද දින දක්වාගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක් ද? මිහිඳු මහ රහතන් වහන්සේගේ දේශනාව තුච්ච ලෙස සලකා ප්‍රතික්ෂේප කිරීමක් නොවන්නේ ද?

(ඒ) මෙම ගනුදෙනුවලට සම්බන්ධ අරමුදල් එතෙර ප්‍රේෂණය නොකරන ලෙසට මහබැංකුව විසින් කරන ලද ප්‍රකාශිත විධානය සැහැසි ලෙස උල්ලංඝනය කරමින්, විනිමය පාලකවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශ කර ඇති පරිදි, 2008.12.12 සහ 2009.04.14 දිනයන් අතර ස්ටැන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව විසින් එක්සත් ජනපද ඩොලර් 107,778,700/- ක් රටෙන් පිට ප්‍රේෂණය කොට ඇත. ඔහුගේ දිවුරුම් ප්‍රකාශයෙහි මෙය ප්‍රතික්ෂේප කර සිට, දැන් රට අතහැර ගොස් ඇති ක්ලයිව් හැස්ව,ඨට එරෙහිව නීතිපතිතුමා විසින් නඩු නොපැරුවේ මන් ද? ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව විසින් එවැනි මුදල් SIERRA ගිණුමකට බැර නොකර ඇති බැවින්, මහබැංකුවේ අධිපතිවරයාගේ ඇනුදැනුම සහ ඔහුට එළිදරව් කිරීමකින් යුතුව, බැංකුවක් යළි ගොඩනැංවීම සඳහා කොටස් අත්පත් කර ගැනීම සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 3 ක් මෙරටට ප්‍රේෂණය කිරීම සඳහා ආධාර අනුබල දුන් චෝදනාවකට පාර්ලිමේන්තු මන්ත්‍රී රවි කරුණානායකට එරෙහිව නඩුවක් පමුණුවීම හා මෙය සසඳා බලනු මැනවි.

11\. (අ) අපචාරාත්මක හිල්ටන් හෝටල් වංචාව බැලුබැල්මට තදබල වංචනික නඩුවක් ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කර නිගමනය කරන ලද අතර, විශේෂ ජනාධිපති විමසීම් කොමිෂන් සභාවක් විසින් අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතුව සාක්ෂිකරුවන් 28 දෙනෙකුගේ සාක්ෂි සටහන් කරන ලදුව, රජයට එරෙහිව වංචා කිරීමේ සාධක මත පුද්ගලයින් 4 දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කරන ලදී. සමාගමේ විගණකරුවන් වුන KPMG පොඩ් රෝඩ්ස් තෝර්ටන් සහ සමාගම ඉවත් කරන ලෙසට වාණිජ මහාධිකරණය විසින් නියෝග කරන ලදී.



බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ දිසා අධිකරණයේ
දිවුරුම් දුන් භාෂා පරිවර්තක
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. කා: 2454929
ඇමරිකානු තානාපති කාර්යාලය
ඉදිරිපිට

(ආ) එම අවස්ථාවේදී විදේශ විනිමය සංචිතය උග්‍ර අන්දමින් පහත් මට්ටම පැවතීමත් සහිතව රටෙහි විදේශ ණය ගැනීම් මත ජත්‍යන්තර හරස් පැහැර හැරීමකට හෙළීම මාගේ කලෝචිත ක්‍රියා මාර්ගය මගින් වලක්වාලන ලදී. වරද සිදුකල පාර්ශවකරුවෙකු වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එන්.චොක්සි ද එකී චෝදනා ලැබ සිටීම නොතකමින්, රනිල් වික්‍රමසිංහ ඇතුළු බොහෝ දෙනෙකු උක්ත සන්දර්භය පිළිබඳ මාගේ ක්‍රියා මාර්ගය අගය කොට පැසසුමට ලක් කරන ලදී.

(ඇ) කලින් ජනාධිපති කුමාරතුංග විසින් විශේෂ ජනාධිපති විමසීම් කොමිෂන් සභාවේ වරෙන්තු බලපත්‍රය දීර්ඝ නොකරන ලදී. පසුව මට පාපොච්චාරණය කළ පරිදි, ඊට හේතුව වී ඇත්තේ චෝදනා ලැබ සිටි එක පුද්ගලයකු වුන පාර්ලිමේන්ත්‍ර මන්ත්‍රී කේ.එන්.චොක්සි ජනාධිපති නීතිඥ 2000 අගෝස්තු මස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැන වීමට සහයෝගය දැක්වීමට එකග වන ලදුව, අධිකරණ සහ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය ජී.එල්.පීරිස් ජනාධිපතිනිය සමග මැදිහත් වීමය.

(ඈ) නීතිපති ජනාධිපති නීතිඥ තිලක් මාරපන විසින් නිශ්චය කරන ලද පරිදි ඔහු නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වන සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාවේ කලින් සමාජිකයකු වශයෙන් ව්‍යවස්ථාපිත විධානය කර ඇති පරිද්දෙන් ක්‍රියා කිරීමට අපොහොසත් වීමෙන් අමාත්‍ය ජී.එල්.පීරිස් ද බලපෑමකට ලක්වූ අයකු වන අතර, මෙම මහ පරිමාන නින්දිත වංචාව වසන් කිරීම සඳහා ඔහු විසින් ආනුෂංගිකව මතභේදකාරී තත්වයක් ඇති කරන ලදී.

(ඉ) සාපරාධීකාරීත්වයක් පිළිබදව බිඳහෙළිය නොහැකි සාක්ෂි ඇති බවට එවකට නීතිපතිතුමා විසින් එකඟ වන ලදුව, මෙම නින්දිත වංචාව පිළිබදව විමර්ශනය කොට අවශ්‍ය වන්නාවූ ක්‍රියා මාර්ගයන් ගැනීම සඳහා, ආනුෂංගිකව කුමාරතුංග ජනාධිපතිනිය විසින් 2004 හිදී එය අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව ලවා කරවන ලෙසට පොලිස්පතිට විධානය කරන ලදී.

(ඊ) ආනුෂංගිකව අපරාධ විමර්ෂන දෙපාර්තමේන්තුව විසින් මාගේ කටඋත්තරය සටහන් කර ගන්නා ලද අතර, එය මත මූලික ලේඛණ විශේෂ ජනාධිපති විමසීම් කොමිෂන් සභාව වෙනුවෙන් ජනාධිපතිතුමාගේ කලින් ලේකම්වරයා විසින් සුරක්ෂිතව තැබීමට භාර දී තිබුණු ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවේ තිබෙන බව සොයා ගන්නා ලදී. එසේ ඒවා තිබෙන බවට දැන ගැනීමෙන් ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් මුල් ලේඛණ ලබා ගන්නා ලෙසට ඔබ විසින් ජාතික ලේඛණාරක්ෂණ නීතියේ නියමයන් අනුව අපරාධ විමර්ෂන දෙපාර්තමේන්තුවට බලය පවරන ලද්දේ නමුත් කුතුහලයක් දනවන ලෙසට කිසිදු උනන්දුවක් නොදක්වමින් මෙම කාරණය පිළිබදව ඉදිරි කටයුතු කළේ නැත.

(උ) ඉන් අනතුරුව, අප රටෙහි නීතියේ ආධිපත්‍යh බලාත්මක කිරීම සඳහා මෙම කාරණයෙහි වැදගත්කම අවධාරණය කරමින් ඔබ විසින් නීතිපතිතුමා වෙත 2007.03.15 දින දරණ ලිපිය පවා යවන ලද අතර, එවකට නීතිපතිතුමා විසින් එය නොතකා හරින ලදී. විමර්ශන ඉදිරියට ගෙන යාමට වඩා විමර්ෂණ අධෛර්යමත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් වැඩිමනත් ප්‍රශ්ණ මතුකර සිටි බව අපරාධ විමර්ෂන දෙපාර්තමේන්තුව විසින් මට දන්වන ලදී. මෙය ඇත්ත වශයෙන්ම අප රටෙහි විශාලතම වංචාවන්ගෙන් එකක් වන බව අපරාධ විමර්ෂන දෙපාර්තමේන්තුව විසින්ම පිළිගන්නා ලදී.සමාජීය දේශපාලන සහ බලගතු පුද්ගලයන්ට බලපාන කල්හි, අප රටෙහි නීතියේ ආධිපත්‍ය බලාත්මක කිරීමේ අගතිගාමී ආකාරය පිළිබදව මෙයින් පර්මාධික ලෙසට කියාපාන්නේ නැති ද?

(ඌ) මාගේ වෘත්තීමය සේවාවන්ටද ඇතුළුව, මට එරෙහිව යොදවන ලද නොයෙකුත් අවහිරතාවයන් සහ දැඩි පීඩාවන් මධ්‍යයෙහි උනන්දුවෙන් යුතු මාගේ ක්‍රියාදාමයන්ට ආනුෂංගිකව විදේශීය හවුල්කරුවන් විසින් අඩුකල පොලී අනුපාතිකයක් මත, වැඩිදුර වසර 15 ක කාලසීමාවකට ඉතිරි ණය මුදල ප්‍රතිලේඛණගත කරමින්, 1995 හිදී දසවසරක එකතු වුනු පොලිය සහ මුල් මුදලින් 30% ක් කපා හරින ලදී. මෙය එක්සත් ජනපද ඩොලර් මිලියන 207 කට ගණනය වුනු 1995 ජුනි මසදී ශ්‍රී ලංකා මුදලින් රුපියල් මිලියන 10,200/- කට සමාන වුන අතර, අද දිනට එය 12% ක පොලී අනුපාතිකයක් වන ශ්‍රී ලංකා රුපියල් මිලියන 55,000/- කට එක්සත් ජනපද ඩොලර් මිලියන 470/- කට සමාන වේ. මෙම සන්දර්භය මත, එහි පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් වනු ඇතැයි ප්‍රකාශ කරමින් හම්බන්තොට ගුවන් තොටුපල ඝෝෂාකාරී උත්සවාකාරයෙන් යුතුව දියත් කිරීම මහා හාස්‍ය උපදවන්නක් විය.



බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ දිසා අධිකරණයේ
දිවුරුම් දුන් භාෂා පරිවර්තක
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. ක: 2454929
ඇමරිකානු තානාපති කාර්යාලය
ඉදිරිපිට

(එ) මෙවා හුදෙක් සිවිල් නඩුවන අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අතුරු ඉන්ජන්ෂන් තහනම් ස්ථිර කර සිටීමෙන් අනතුරුව, ජාතික සහ මහජන උන්නතිය නොතකමින් නීතිපතිතුමා නිරන්තරයෙන්ම මට එරෙහිවූන අතර, බලයේ සිටි අය බලපෑම් සහිතව අයුතු පීඩනයන් කරන ලද හෙයින් මට පහසුවෙන්ම මෙම නඩු අතහැර දමන්නට හැකියාව තිබුනි. පුද්ගලික වාසි තකා රාජ්‍ය කොන්ත්‍රාත්තු සඳහා අමාත්‍යවරුන් සහ නිළධාරීන් පෙළඹවීමේ සාකච්ඡා පවත්වන අයවළුන් සේම, "සරල ලෙසින් පැමිණිලිකරු වශයෙන් පෙනී නොසිටීමෙන් නඩු අතහැර දැමීමට මූල්‍යමය පෙළඹවීම්" කිරීමට උත්සාහ දරමින් ඇත්ත වශයෙන්ම උනන්දුවක් දැක්වූ පාර්ශවයන් මට ප්‍රවේශවිය. එම ලැජ්ජා නැති උත්සාහයන් මවිසින් නිග්‍රහයෙන් යුතුව නොසැලී සහ දේශානුරාගීව ප්‍රතික්ෂේප කර සිටින ලද අතර, රට සඳහා ඉහත කී වාසිය මුදුන් පමුණුවා ගත්තෙමි.

(ඒ) නීතිය බලාත්මක කරන්නාවූ බලධාරීන්ගේ අක්‍රියභාවය සහ රජයේ හිත පිණිස යහපත උදෙසා, කාලය සහ වියදම් දරමින් නොයෙකුත් පීඩාකාරී නඩුවලට එරෙහිව ක්‍රියා කිරීමේ හේතු තත්වයන් කරණකොට ගෙන රජයේ යහපත සුරක්ෂිත කිරීමට සහ මාගේ පෙරැත්තය මත එවකට නීතිපතිතුමාගේ උපදෙස් පරිදි ඉඩම රජයට පැවරෙන ලදුව රජය විසින් හෝටල් ව්‍යාපෘතියේ 100% ක අයිතිය දැරීම ස්ථිර කිරීම පිණිස මම ඇවර කිරීමේ නඩුවක් පැවරුවෙමි. *මවිසින් පවරන ලද එම නඩුවට මහා භාණ්ඩාගාරයේ ලේකම් පී.බී.ජයසුන්දර මාර්ගයෙන් ක්‍රියා කරමින් රජය සහ නීතිපතිතුමා විපක්ෂ විය.*

(ඔ) සමාගම විසින් රජයට 2008.12.31 දිනට රුපියල් මිලියන 8718 ක පැහැර හරින ලද ණයක් ද එයින් රුපියල් මිලියන 250 ක් නොගෙවූ ලෙසට පැවති රුපියල් මිලියන 452 ක් පමණක් වූන ප්‍රකාශිත ප්‍රාග්ධනය කෙරෙහි රුපියල් මිලියන 9043 ක එකතුවූන පාඩුවක්ද පවතී. එසේ දී ඇති හේතු තත්වයන් මත සමාගම ඈවර 1, යුතු බවට විධාන කර ඇති 2007 අංක.7 දරණ සමාගම් පනත සමාගම සහ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ඇතුලුව එහි අධ්‍යක්ෂකවරුන් තදබල ලෙස උල්ලංඝනය කර ඇති අතර, එවැනි ණය මුදලක් වෙනුවෙන් දැන් ඔවුන් පුද්ගලිකවම වගකිව යුත්තන් වන්නෝ ය. බහුතර වශයෙන් *රජයට අයිති සහ රජයේ පාලනය යටතේ පවතින සමාගමක් විසින් සාහසික ලෙස නීතිය උල්ලංඝනය කළ හැකි ද? එවැන්නක් ඉවසා දරා සිටිය හැකි ද?*

12. (අ) බදු සමාවක් මුවාවෙන් වූන අපකීර්තිමත් 2003 ක්ෂමා පනත අහෝසි කිරීමෙන් අනතුරුව, ආදායම් බදු පනතේ විධිවිධාන යථා පරිදි ක්‍රියාත්මක කරවීම සඳහා මාවිසින් රිට් ආඥා ඉල්ලීමක් මහජන හිත පිණිස ඉදිරිපත් කර සිටින ලදුව, එය අභියාචනාධිකරණයෙහි පවතින බව ඔබ දන්නෙහිය. ආයාචනය කර ඇති පරිදි රිට් ආඥා ප්‍රදානය කරනවාට නීතිපතිතුමා විසින් 2005 ඔක්තෝබර් තාක්වූ පරිදි එකඟවූන අතර, ආදායම් බදු පනතේ විධිවිධානයන් යථා පරිදි බලාත්මක කිරීම ස්ථාපිත කිරීමට අධිකරණයට පොරොන්දුවී එකග වෙමින් නීතිපතිවරයා විසින් සමථය කොන්දේසි සමාජන කරන ලදී.

(ආ) ප්‍රධාන ප්‍රශ්ණ වන්නේ ආදායම් බදු පනතේ විධිවිධානයන් යටතේ සහ එහි නියමයන් ප්‍රකාර විධානාත්මක අවශ්‍යතාවයන් යථා පරිදි ඉටු කිරීමෙහිලා ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා විසින් (1)අල්ලස් පිළිබඳ සැක අවස්ථාවන් අල්ලස් කොමිෂන් සභාවට වාර්තා කිරීමටත්, (11) රේගු පනත යටතේ වරද සිදු කිරීමේ සැක අවස්ථාවන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කිරීමටත්, සහ (111) විනිමය පාලන පනත යටතේ සිදු කල වරද සිදු කිරීමේ සැක අවස්ථාවන් විනිමය පාලකවරයාට වාර්තා කිරීමටත් ය.

(ඇ) මෙම වැදගත් ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ඉටු නොකරන ලද අතර, අධිකරණයේ වාර්ථා කිරීම සඳහා ව්‍යවස්ථාපිතය ඉටු කරන බවට පොරොන්දු ලබා ගැනීමට 2005 ඔක්තෝබර් සිට නීතිපතිතුමාට නොහැකි වී තිබේ.

(ඈ) සාපරාධී නඩු පැවරීමක ප්‍රතිඵලයක් ගෙන දෙන්නාවූ විමර්ශණය සඳහා එම කාරණය අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට යොමු කිරීම වන විට එමගින් දැනුවත්ව හෝ නොදැනුවත්ව අදාල ගොනු සහ වාර්තා අතුරුදහන් වීමට අවස්ථාව සලසාලමින් එවකට ආදායම් බදු කොමසාරිස් ජනරාල් සහ දැන් මුදල් අමාත්‍යාංශයේ උපදේශක ආර්.පී.එල්.වීරසිංහ, මහා භාණ්ඩාගාරයේ ලේකම් පී.බී.ජයසුන්දර සහයින් ඇනිව ක්‍රියා කරමින්, කාරණය ගැන විමර්ශනය කිරීමට අභ්‍යන්තර කමිටුවක් පත් කරමින්, 2005 හිදි කාරණය අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත යොමු කරවීමට මා ගත් උත්සාහයට බාධා පැමිණවීමද වෙනත් දේ අතර අනාවරණය කරමින් නින්දිත සහ මහා පරිමානයේ VAT වංචාව පිළිබඳව පරීක්ෂා කල ජනාදිපති කොමිෂන් සභාව ඉදිරියේදී මවිසින් විස්තීරණ ලෙස සාක්ෂි දෙන ලදී. අතිමහත් මහජන මුදල් සම්භාරයක් අඩංගු වන තරමින්ම ජනාධිපති විමසීම් කොමිෂන් සභාවේ වාර්තාවේ මහජනයා අභියස ප්‍රසිද්ධියට පත් කල යුතු නොවන්නේ ද?



බී තිස්ස ප්‍රනාන්දු
කොළඹ දිසා අධිකරණයේ
දිවුරුම් දුන් භාෂා පරිවර්තක
169/4 ගාලු පාර, කොල්ලුපිටිය
කොළඹ 03.
දු. කෑ: 2454929

13. (අ) පොදු පෙරමුණ 2004 අප්‍රේල් මැතිවරණයේ දී බලයට ආවේ, පොදු පෙරමුණ රජය බලයට පැමිණ පනවන ලද පළමු පනතින්ම අහෝසි කරන ලද අපකීර්තිමත් 2003 ක්ෂමා පනත රජයට අතිවිශාල පාඩු සිදුකරමින් මහජන මුදල් වංචා කර ඇති බව සහ එය නීතියේ ආධිපත්‍යයට එරෙහිව වන බවටත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද ප්‍රකාශනයේ මහිමෙන් බව ඔබ දන්නෙහි ය.

(ආ) එසේ වූයේ, මම පුද්ගලිකවම එම නින්දිත ක්ෂමාවට එරෙහිව මුලපුරා නොපසුබටව ඉදිරියට ගෙන ගිය උද්යෝගීමත් ව්‍යාපාරයට ආනුෂංගිකව වන අතර, වංචාව සහ දූෂණයට එරෙහිව එලදායි ලෙස සටන් වැද රටෙහි යහ පාලනය ස්ථිර කරමින් නීතියේ ආධිපත්‍යය බලාත්මක කරන බවට රටට ප්‍රසිද්ධියේම ගෙනහැර දක්වමින් මම පොදු පෙරමුණ මැතිවරණ ව්‍යාපාරයෙහි කේන්ද්‍රීය චරිතයක් රඟ පෑවෙමි.

(ඇ) එවන් හේතු තත්වයන් මත මට නිසර්ගත තැකීමක් සහ මහජනයාට යුතුකමක් සහ බැඳීමක් ඇති බැවින්, නීතියේ ආධිපත්‍යයට නිහින සැලකීමකින් සහ ගරු කිරීමකින් තොරව තියුණු ලෙස යහපාලනය සොදා පාළුවී යද්දී සහ, මෙම ඊ-මේලයේ ආරම්භයේ සඳහන් පරිදි ජනාධිපතිතුමා විසින්ම පිළිගෙන ඇති පරිදි ව්‍යාප්ත ලෙස පවතින වංචාව සහ දූෂණය අභිමුඛයෙහි මට හුදු නිහඬ පාර්ශවයක් ලෙස සිටිය නොකැහිය.

රටෙහි සහ මහජනයාගේ යහපත වඩාත් පුළුල් ලෙස සැලකිල්ලට ගනිමින්, ඔවුන් වෙනුවෙන් භාරයෙහි කළමණාකරණය කරනු ලබන, මහජන සම්පත් සම්බන්ධ වන්නාවූ ජාතික සහ පොදු වැදගත් කමින් යුතු පූර්වෝක්ත ප්‍රශ්නයන්ට ඔබගේ සැලකිලිමත් ප්‍රතිචාරයන් මම අපේක්ෂා කරමි.

ඔබගේ හිතවත්,
නිහාල්

**සත්‍ය පිටපතකි.**

**අත්සන් කලේ:- නිහාල් ශ්‍රී අමරසේකර**

------------------

**අදාල ලියවිල්ලේ සත්‍ය සහ නිවැරදි පරිවර්තනයක් බවට සහතික කරමි.**

15/02/2010

**බී. තිස්ස ප්‍රනාන්දු.**
කොළඹ දිසා අධිකරණයේ දිවුරුම්දුන්
භාෂා පරිවර්තක,
169/4, ගාලුපාර,
කොල්ලුපිටිය,
කොළඹ 03.
දු. ක. 011 - 2454929

**බී තිස්ස ප්‍රනාන්දු**
**කොළඹ දිසා අධිකරණයේ**
**දිවුරුම් දුන් භාෂා පරිවර්තක**
**169/4 ගාලු පාර, කොල්ලුපිටිය**
**කොළඹ 03.**
**දු. කː 2454929**
**ඇමරිකානු තානාපති කාර්යාලය**
**ඉදිරිපිට**